මුසාලි ප්‍රාදේශීය සභාව

මන්නාරම දිස්ත්‍රික්කය

----------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 අප්‍රේල් 25 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 28 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 24 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

1.2 විගණන මතය

-------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයෙහි විස්තර කර ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කර නොතිබුණි.

(ආ) වත්කම්, වගකීම් ආදායම් සහ වියදම් සඳහා ප්‍රමාණවත් ලෙජර ගිණුම් පවත්වා නොතිබුණි. ජර්නල් සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා වූ උසාවි දඩ රු.571,665 ක් ගිණුම් ගතකර නොතිබුණු අතර ඒ නිසා ආදායම රු.571,665 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා වූ රු.639,548 ක් වූ ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම සඳහා දරන ලද වියදම් ගිණුම් ගතකර නොතිබුණි.

(ඉ) 2013 වර්ෂය සඳහා විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේ දරන ලද රු.283,008 ක් වූ වියදම් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.2 අනුකූල නොවීම

---------------------

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවූ පහත සඳහන් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභා (මූල්‍ය සහ පරිපාලන) රීති - 1988 | | |
| i. රීති අංක 5(xii) | - | මුදල් සහ ගබඩා පිළිබඳව කටයුතු කරන නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් ආරක්ෂක ඇප පිළිගැනීම සභාපතිවරයා විසින් සනාථ කර නොතිබුණි. |
| ii. රීති අංක 13-14(2) | - | අයවැයගත වියදම රු.2,813,071 කින් ඉක්මවා තිබුණු අතර ඒ සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කර නොතිබුණි. |
| iii. රීති අංක 59 | - | වර්ෂය ආරම්භයේදී වෙළඳ ආයතනයන් පිළිබඳව සමීක්ෂණයක් කර ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| iv. රීති අංක 218 | - | සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් ගොඩනැගිලි සහ දේපල සමීක්ෂණයට භාජනය කර නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

--------------------------------------

| | | | |
|---|---|---|---|
| i. | මුදල් රෙගුලාසි 371(5) සහ 373(1) | - | 2013 දෙසැම්බර් 31 ට පැවති රු.533,061 ක් වූ අත්තිකාරම් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| ii. | මුදල් රෙගුලාසි 571(2) | - | 2013 දෙසැම්බර් 31 ට පැවති රු.405,510 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1988 අංක 86 දරන පණතින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පණත | - | ඝාතකාගාර 2 ක් සඳහා සභාව අවසරය ලබාගෙන නොතිබුණි. |
| (ඈ) | අංක 1ඒ1/2002/02 සහ 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය | - | පරිගණක සහ උපාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 111 පරිච්ඡේදයේ 3.4.3 වගන්තිය | - | වාර්ෂිකව සැපයුම්කරුවන් ලියාපදිංචි කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම් අතිරික්තය රු.2,318,791 ක් වූ අතර එයට එරෙහිව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.178,194 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

---------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

-------------------------------------------------------------------

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| බදු කුලී | 2,550,000 | 2,491,587 | 689,000 |
| බලපත්‍ර ගාස්තු | 270,000 | 1,095,000 | - |
| සේවා ගාස්තු | 1,245,000 | 777,025 | - |
| වරෙන්තු ගාස්තු, දඩ සහ අධිභාර | 600,000 | - | - |
| වෙනත් | 243,500 | 107,085 | 171,344 |
| එකතුව | 4,908,500 | 4,470,697 | 860,344 |

2.2.2 මුද්දර ගාස්තු

-----------------

2006 සිට 2013 දක්වා කාලපරිච්ඡේදය සඳහා සභාවට අයවිය යුතු රු.2,363,894 ක් වූ මුද්දර ගාස්තු ලබාගැනීම පිණිස සභාව මේ දක්වා කටයුතු කර නොතිබුණි.

2.2.3 අයකරගත යුතු ආදායම්

----------------------------

කඩකුලී, සී සෑමේ යන්ත්‍ර කුලී සහ ගවමස් කඩ කුලී වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යුතු හිඟ මුදල රු.689,000 ක් විය. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පණතේ විධිවිධාන ප්‍රකාරව මෙම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

වාහන උපයෝජනය

---------------------------

සභාවේ වාහන 41 කට අදාළ දෛනික ධාවන සටහන්, ඉන්ධන ලේඛණය සහ ලොග් පොත් පරික්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

i. වාහන 28 ක් සඳහා ආදායම් බලපත්‍ර සහ රක්ෂණ ආවරණ ලබා ගෙන නොතිබුණි.
ii. සියළුම වාහන වල දෛනික ධාවන සටහන් විගණනය සඳහා ඉදිරිපත් නොකරන ලදී.
iii. අංක 41/90 සහ 1990 ඔක්තෝබර් 10 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මාස 6 කට වරක් වාහන වල ඉන්ධන පරිභෝජනය පරික්ෂා කර නොතිබුණි.
iv. වාහන 41 ක අයිතිය සභාව වෙත පවරා නොතිබුණි.

3.2 නිෂ්ක්‍රීය සහ ඌණ උපයෝජිත භෞතික සම්පත්

-----------------------------------------------------------

පහත සඳහන් වාහන සහ යන්ත්‍ර දීර්ඝ කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

| වාහන අංකය | වාහන වර්ගය | නිශ්ක්‍රීය කාල පරිච්ඡේදය |
|---|---|---|
| 3191 | අස්වනු නෙලීමේ යන්ත්‍රය | වර්ෂ 03 |
| - | කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය | වර්ෂ 03 |
| එල්ඊ-6500 | ජල බවුසරය | වර්ෂ 02 |
| එස්එච්-0701 | ට්‍රේලරය | වර්ෂ 02 |
| 10 එම් | සී සෑමේ යන්ත්‍රය | වර්ෂ 02 |

3.3 අභ්‍යන්තර විගණනය

--------------------------

සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4. පද්ධති සහ පාලන

------------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

i. ගිණුම්කරණය
ii. මූල්‍ය පාලනය
iii. ආදායම්
iv. වත්කම්
v. කොන්ත්‍රාත්තු